## ඇමුණුම 9

## උපකරණ නඩත්තුව හා ක්‍රමාංකනය

### මිනුම් උපකරණ නඩත්තු කිරීම

ලබාගන්නා මිනුම්වල නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා බර කිරන දිග/උස මනින උපකරණ නියමිත ආකාරයට රැකබලාගැනීම අත්‍යවශ්‍යයි. උපකරණ පිරිසිදුව තබා ගන්න. සාමාන්‍ය කාමර උෂ්ණත්වයේ ගබඩා කරන්න. තෙම්මෙන් හා තෙත් ගතියෙන් ආරක්ෂා කරන්න.

උපකරණය ප්‍රථම වරට භාවිතා කිරීමට පෙර එහි නිරවද්‍යතාවය සම්මත මිනුම් හා සමග සසඳා පරීක්ෂා කරගත යුතුයි. ඊට පසු බර කිරන උපකරණය හා දිග/උස බලන උපකරණය ඒ සඳහා නියමිත කාල පරාසවලදී සම්මත මිනුම් හා සමග සසඳා නිරවද්‍යතාවය පරීක්ෂා කර බලන්න.

### බර මනින උපකරණ වල නිරවද්‍යතාවය තහවුරු කිරීම

බිම් තරාදිය සඳහා මාස තුනකට වරක්ද දුනු (ස්ප්‍රින්ග්) තරාදිය සඳහා මසකට වරක්ද, සම්මත බර කට්ටල යොදා නිරවද්‍යතාවය තහවුරු කරගන්න.

ළදරු බිම් තරාදිය සඳහා ග්‍රෑ. 10 ග්‍රෑ. 100 ග්‍රෑ. 500 කි.ග්‍රෑ. 1 හා 2 යැයි දන්නා බර ඇති පඩි කිරා බලන්න. දුනු (ස්ප්‍රින්ග්) තරාදිය සඳහා ග්‍රෑ. 10 සම්මත පඩිය අවශ්‍ය නැත. වැඩිහිටි බිම් තරාදිය සඳහා ග්‍රෑම් 100 සිට කි.ග්‍රෑ. 5 දක්වා පඩි යොදාගත හැකිය).

සම්මත තරාදි පඩි නොමැති විට දන්නා නිවැරදි බරක් යොදා ගත හැකිය.

කිරන ලද බර වැරදි නම් උපකරණය ක්‍රමාංකනය කරන්න. සිදුවන වරද ස්ථාවර නම් (උදා: සෑම මිනුමක් සඳහාම කි.ග්‍රෑ. 0.2 ක් වැඩිනම්) පාඨාංකය සුදුසු පරිදි වෙනස් කරන්න (උදා: කි.ග්‍රෑ. 0.2 ක් අඩු කර). මෙම ස්ථාවර වරද කාලයත් සමග වෙනස් වේ දැයි යන්න පිළිබඳව පරීක්ෂාවෙන් පසුවිය යුතුය.

පාඨාංකයේ වරදේ විශාලත්වය එක් එක් මිනුම සඳහා වෙනස් වේ නම් බර කිරන උපකරණය වෙනස් කළ යුතු වේ.

### දිග/උස මනින උපකරණය පරීක්ෂා කිරීම

- උපකරණයෙහි කොටස් සවි කිරීමෙන් අනතුරුව දන්නා දිගක් ඇති දඬු කිහිපයක දිග බලා උපකරණය නිවැරදිව සවිකර ඇති බව තහවුරු කරන්න.
- කොටස් එකිනෙක හා සෘජුව හා ශක්තිමත්ව සවි වී ඇති බව තහවුරු කරගන්න. නැතිනම් සුදුසු පරිදි සකස් කරන්න.
- මිනුම් පටිය කියවිය හැකිදැයි බලන්න. නැතිනම් අළුත් මිනුම් පටියක් සවිකර ගත යුතු වේ.